

# චූටි බබාගේ කතන්දර

සහන්මී මෙතාරා යහතුගොඩ

# තිළිණය

මාගේ පන්තිය 2A ශ්‍රේණිය භාර

ගුරුතුමිය වන සමන්මලී හෙට්ටිආරච්චි

ගුරු මෑණියන්ටත්, ආදරණීය අම්මා,

තාත්තා, අක්කලා, අයියලා, නංගිලා,

මල්ලිලා, ආච්චිලා , සීයලා සහ මාගේ

මිතුරු මිතුරියන්ට " චූටි බබාගේ

කතන්දර" පොත් පිංචය ඉතා

ගෞරවයෙන් යුතුව පුදකර සිටිමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක "වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

# පටුන


| *අනු අංකය* | *විස්තරය* | *පිටු අංක* |
|---|---|---|
| **1** | **ටොම් සීයාගේ පරණ බඩු කඩේ** | 1 – 4 |
| **2** | **මලීගේ උපන් දින බෝලය** | 5 – 7 |

# ටොම් සීයාගේ පරණ බඩු කඩේ

ටොම් කියලා සීයා කෙනෙක් හිටියා.මේ සීයාට පරණ බඩු කඩයක් තිබුණා. මේ ටොම් සීයාට ගමේ මිනිසුන් කඩේට බඩු  දුන්නා. ඒත් එන්න එන්න ම කඩේට ලැබෙන බඩු අඩු වුණා.ඉතිං මේ ටොම් සීයාට හිතුණා “මම ම ගිහින් බඩු හොයා ගන්නවා” කියලා.



ඉතින් ටොම් සීයා කැලේ දවස් දහයක් විතර ඇවිද්දා. එකළොස්වෙනි දවසේ ටොම් සීයට ගුහාවක් හමු වුණා. ටොම් සීයට නින්දක් තිබුණේ නෑ. ටොම් සීයට හරි මහන්සියි. හයයි වෙලාව. ටොම් සීයා ගුහාව අසල ගහක් යට නිදා ගත්තා. සීයා නැගිටිනකොට පාන්දරත් වෙලා. සීයා උදේට කන්න කෑම හොයාගන්න කියලා ඇපල් ගහක් ළඟට ගියා.




සීයා ඇපල් ගහෙන් ගෙඩි දෙකක් කඩා ගත්තා. සීයා ආපහු ගුහාව ළඟට ගියා. සීයා ඇපල් කන ගමන් වට පිට බලමින් ගුහාව තුලට ගියා. ඇතුලේ ගලක් තිබෙනවා සීයා දැක්කා. ඒ ගල එහා පැත්තේ දිලිසෙන යමක් තිබුණා ටොම් සීයා දැක්කා. සීයා හෙමිහිට ගල ළඟට ගියා. ටොම් සීයා ඒ ගල එහා පැත්ත බැලුවා.



එතන තිබුණේ මුදු, වළලු සහ ඔටුනු. “නිධානයක්! මට ම ලැබුණු නිධානයක්!” සීයට කියවුණා. ටොම් සීයා ඒ ඔක්කොම අරගෙන ආයෙමත් ගමට ගියා. ඒ රන් බඩු විකුණා කඩේ අලුත්වැඩියා කළා. දුප්පත් මිනිසුන්ටත් උදව් කරමින් ජීවත් වුණා.

<u>“උත්සාහවන්තයින් ළඟට වාසනාව ගෙනෙනවා”</u>

ටොම් සීයගේ කතාවෙන් අපට ලැබෙන ආදර්ශයයි ඒ.



# මලීගේ උපන් දින බෝලය

මලීට මලීගේ අම්මා උපන් දිනයට බෝලයක් අරං දුන්නා. දවසක් මලී මලීගේ බෝලෙත් අරගෙන සෙල්ලම් කරන්න ගියා. මලී සෙල්ලම් කරමින් ඉන්න විට දී මලීගේ බෝලේ කැලේට වැටුණා. මලී කෑගහලා ඇඬුවා. මලී අඬන සද්දේ අහිලා අලි පැටියෙක් ආවා.



“ඇයි ඔයා අඬන්නේ?” අලි පැටියා ඇහුවා. “මම සෙල්ලම් කරනකොට මගේ බෝලේ කැලේට වැටුණා” මලී කිව්වා. “ආ.......මම ඒ බෝලේ අරන් දෙන්නං. ඔයා එතකං වෙන බෝලයක් ගන්න” කියලා අලි පැටියා කිව්වා. “බැහැ, මට අම්මා උපන් දිනයට දුන්න බෝලේ, ඒ නිසා මට ඒ බෝලේ ඕනි” මලී කිව්වා. “හා! හොඳයි, හෙට ළිඳ ළඟට එන්න.” කියලා අලි පැටියා කිව්වා.



“හා” කියලා මලී කිවුවා. මලී ගෙදර ගියා. අලි පැටියත් ගෙදර ගියා. අලි පැටියා කාමරේට යන කොට මලීගෙ බෝලේ අලි පැටියාගේ ඇඟ උඩ තිබුණා. අලි පැටියා මලීගේ බොලේ තියලා නිදා ගත්තා. මලී උදෙන්ම ළිඳ ළඟට ආවා. අලි පැටියත් ආවා. අලි පැටියා මලීගෙ බොලේ මලීට දුන්නා. ඊට පස්සේ මලී සහ අලි පැටියයි සතුටින් සෙල්ලම් කළා.



# පසවුදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම, ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම  වැනි බහුවිධ පරමාර්ථ ඇතිව  2014 වසරේ දී මා විසින්  අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන  ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට  මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි  ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි  පතමු .

.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල්  දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 01

ISBN  978-624-206-841-1